# ශ්‍රී ලංකාව තුළ චීන උප සංස්කෘතියක් බිහිවීමේ ප්‍රවණතා : චීන-ශ්‍රී ලංකා සබඳතා පිළිබඳ අධ්‍යයනයක්

*නිමේෂිකා ද සිල්වා [1] සහ පුෂ්පකුමාර, ඒ. පී. ආර්. [2]*

දූරාතීතයේ පටන්ම චීනය හා ශ්‍රී ලංකාව අතර ගොඩනැගුණු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සබඳතාවන්හි ස්වරූපය වර්තමානය වන විට වෙනස් මගකට යොමු වෙමින් තිබේ. නිදහසින් පසු චීන රජය විසින් ආයෝජන රාශියක් ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රාජ්‍යයන්හි සිදු කරනු ලැබීමත් සමග චීන ජාතිකයින් සහ ශ්‍රී ලාංකිකයින් අතර සබඳතා වඩාත් තහවුරු වෙමින් පවතී. මෙම සබඳතා හරහා අනාගතයේ '**චීන උප සංස්කෘතියක්**' බිහිවීමේ මූල බීජ මේ වන විටද ශ්‍රී ලාංකේය මහා සංස්කෘතියෙහි රෝපණය වෙමින් තිබේ. මහා සංස්කෘතියට ආවේණික වූ අංගෝපාංග මෙන්ම ඊට පරිබාහිර අංගෝපාංගද සම්මිශ්‍රණය වී සැකසෙන කිසියම් ජන කණ්ඩායමකට අයත් සංස්කෘතිය උපසංස්කෘතිය වශයෙන් සරලව අර්ථකථනය කළ හැකිය. මෙම අධ්‍යයනයේ පර්යේෂණාගාරය වනුයේ සමාජයයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත ලබා ගැනීමේ පර්යේෂණ මෙවලම් ලෙසට ගැඹුරු සාකච්ඡා ක්‍රමය සහ සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදි. ප්‍රාථමික හා ද්විතීයික දත්තවල ස්වභාවය අනුව ඒවා සංඛ්‍යාත්මක සහ ගුණාත්මක ලෙස වර්ග කොට, සංඛ්‍යාත්මක දත්ත සංඛ්‍යාත්මක ක්‍රමවේද ඔස්සේද ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේද විශ්ලේෂණය කෙරිණි. ඒ අනුව චීන උපසංස්කෘතිය ගොඩනැගීම කෙරෙහි ශ්‍රී ලංකාවේ ස්වාභාවික වරායන් හා සේද මාවත ඔස්සේ ගොඩනැගුණු සබඳතා මෙන්ම, ඓතිහාසිකව සිදු වූ සංචාර හා ෆාහියන් භික්ෂුවගේ හා චීන වෙළෙඳුන්ගේ ආගමනයද සෘජුවම බලපෑයේය. එමෙන්ම මහායාන බුදුදහම සහ කොන්ෆියුසියස් දර්ශනය චීන උපසංස්කෘතිය මෙරට ගොඩනැගීමට මූලික වූ ආගමික මතවාද වේ. යථෝක්ත පසුබිම කේන්ද්‍රීයව ගොඩනැගෙන උපසංස්කෘතියෙහි චීන ආභාසය වඩාත් පතිතව තිබෙන්නේ භාෂාව, ඇඳුම්-පැළඳුම්, සිරිත්-විරිත්, ගෘහනිර්මාණ ශිල්පය, සහ ආහාර-පාන යන සංස්කෘතිකාංග මතය. මෙම උපසංස්කෘතියෙහි පවතින විශේෂත්වය වන්නේ චීන භාෂාවට අදාළ වචන සහ යෙදුම් අල්ප වශයෙන් භාවිත වීමය. චීන ආහාර වර්ග භාවිතයට පවතින නැඹුරුවද විශේෂාවධානයට යොමු විණි. චීන අවන්හල්වල ක්ෂණික ව්‍යාප්තිය මෙන්ම, චයිනීස් රයිස්, චයිනීස් නූඩ්ල්ස්, චොප්සි, ඩෙවල්, ඇතුළු චීන ආහාරවල

ක්ෂණික ව්‍යාප්තිය පිළිබඳවද විමර්ශනය කරන කල මෙම උපසංස්කෘතිය තුළ ආහාර-පානවලට හිමිවන ස්ථානය කෙබඳුදැයි වටහාගත හැකිය. ඇඳුම්-පැළඳුම් පිළිබඳ විමසීමේදී චීන ජාතිකයින් දෛනික කාර්යයන්හි නියැලීමේ පහසුව සඳහා භාවිත කරන ඇඳුම වන '**ඩෙනිම්**' ශ්‍රී ලංකාවේ තරුණ සහ වැඩිහිටි සියලු දෙනාගේ විලාසිතාවක් බවට පත්ව තිබේ. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ වඩාත් ජනප්‍රිය වෙමින් පවතින **ෆෙංශුයි** ශාස්ත්‍රයද චීන ජාතිකයින්ගෙන් උපසංස්කෘතියට එකතු වූවකි. ඒ අනුව ආගමික විශ්වාස පද්ධතිය මගින්ද මෙම උපසංස්කෘතිය ගොඩනැගීමට විශාල බලපෑමක් සිදුව ඇති බව නිගමනය කළ හැකිය. ශ්‍රී ලාංකේය කලා-ශිල්පවලට හා වෙනත් සංස්කෘතිකාංගවලට මකරා එකතු වීමද මේ සම්බන්ධයෙන් වැදගත්කමක් උසුලයි. මකර වර්ෂය හා මායා දින දර්ශනය ශ්‍රී ලාංකිකයින්ගේ විශ්වාසය දිනාගෙන ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වෙසක් උත්සවය වැනි මෙරටටම ආවේණික උත්සව සැමරීමට යොදා ගැනෙන වෙසක්කූඩු වැනි මෙවලම්ද චීනයේ නිෂ්පාදනය වීම මත චීන වෙළෙඳපොළ මෙරට ස්ථාපිත වන ආකාරය වටහාගත හැකිය. සිනමාව, ටෙලිනාට්‍ය, වේදිකාව හා සංගීතය වැනි සංස්කෘතිකාංගද චීන උප සංස්කෘතියෙහි ආභාසය සහිතව වර්ධනය වන ආකාරය හඳුනාගත හැකි සාක්ෂ්‍ය කොතෙකුත් පවතී. රූපවාහිනිය හරහා විකාශයට පත් වන '**මායා**' කතා පෙළ ඒ අතර සුවිශේෂී වේ. පූර්වෝක්ත සාධක අනුව, මේ වන විටත් චීන උප සංස්කෘතියක ලක්ෂණ ශ්‍රී ලංකාව තුළ පහළ වෙමින් පවතින බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** : චීනය, ශ්‍රී ලංකාව, මහා සංස්කෘතිය, උප සංස්කෘතිය

[1]*Postgraduate Candidate, Department of Public Policy, University of Ruhuna, Sri Lanka. nimeshika.purna@gmail.com*
[2]*Postgraduate Candidate, Department of Public Policy, University of Ruhuna, Sri Lanka. hppushpakumara@gmail.com*